# බස්නාහිර පළාත් ආණ්ඩුකාරවර කාර්යාලය

මேல் மாகாண ஆளுநர் பணிமனை

**GOVERNOR'S OFFICE - WESTERN PROVINCE**

අංක 204, ඩෙන්සිල් කොබ්බැකඩුව මාවත, බත්තරමුල්ල.

இல. 204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.

No. 204, Denzil Kobbekaduwe Mawatha Battaramulla.


ඔබේ අංකය. / உமது இல. / Your Ref. CSWP/ADM/30-38/FI/2024

මගේ අංකය / எனது இல. / My Ref. GOS/ADM/6/2/19

දිනය / திகதி / Date 2024.06.06

"ජනතා හිතවාදී විශිෂ්ඨතම පළාත් රාජ්‍ය සේවාවක්" - "பொது மக்களுக்கு சிறந்த பொதுச் சேவை" - "People Friendly Excellent Public Service"

පාලන අංශය 110133 07 JUN 2024 ADM-30

ප්‍රධාන ලේකම්,
ප්‍රධාන ලේකම් කාර්යාලය
බස්නාහිර පළාත.

<u>මධ්‍යම රජයේ විවිධ අමාත්‍යාංශ වෙතින් ලැබෙන චක්‍රලේඛ ( මූල්‍ය චක්‍රලේඛ හැර) බස්නාහිර පළාතට අදාල කර ගැනීමේ කමිටු තීරණ සඳහා අනුමැතිය ලබා ගැනීම.</u>

උක්ත මැයෙන් යුතුව මා අමතන ලද ඔබේ සමාංක හා 2022.02.29 දිනැති ලිපිය හා බැදේ.

02. ඒ අනුව පහත සඳහන් චක්‍රලේඛයන් පවතින ආකාරයෙන්ම බස්නාහිර පළාත් සභාවට අදාල කර ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා දී ඇති බව කාරුණිකව දන්වමි.

| චක්‍රලේඛ අංකය | චක්‍රලේඛ නිකුත් කළ දිනය | කාරණය |
|---|---|---|
| රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2024 | 2024.04.16 | වයස අවුරුදු 45න් පසුව පත්වීම් ස්ථිර කරන ලද සේවකයින් වෙත විශ්‍රාම වැටුප් ලබා දීම රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 25/2014, 25(2014)(1) සහ 29/2019 සම්බන්ධයෙනි |
| රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/99(XL) | 2024.04.25 | රජයේ නිලධරයන්/ පලාත් රාජ්‍ය නිලධරයන්/ අධිකරණ නිලධරයන් සඳහා නිල ප්‍රවාහන පහසුකම |
| රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2021(IX) | 2024.05.07 | COVID 19 වසංගත සමය තුල විදේශ ගතව සිට පැවති තත්ත්වය හමුවේ නැවත සේවයට වාර්තා කිරීමට අපොහොසත්ව සිටි රාජ්‍ය නිලධරයන් සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කිරීම. |
| සෞඛ්‍ය අමාත්‍යාංශය පොදු චක්‍රලේඛ 02-55/2024 | 2024.04.02 | සෞඛ්‍ය අංශයේ කාර්යය මණ්ඩලය සඳහා නිල ඇඳුම් දීමනා සංශෝධනය |
| සෞඛ්‍ය අමාත්‍යාංශය පොදු චක්‍රලේඛ 02-61/2024 | 2024.04.08 | රජයේ ලියාපදිංචි වෛද්‍ය නිලධාරීන් සඳහා රාජකාරි බාධා පැමිණ සිටීමේ හා ප්‍රවාහන දීමනා (DAT) ගෙවීම සංශෝධනය කිරීම |

සෝමසිරි පල්ලත්තරගේ
ආණ්ඩුකාර ලේකම්
බස්නාහිර පළාත


දුරකතන අංක - 0112-092816
ෆැක්ස් - 0112-092813
විද්‍යුත් තැපැල - governoroffice@secgov.wp.gov.lk

දුරකථන ) 0112669192 , 0112675011
தொலைபேசி ) 0112698507 , 0112694033
Telephone ) 0112675449 , 0112675280

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax ) 0112692913

විද්‍යුත් තැපෑල ) postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
e-mail )

වෙබ් අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )
website )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

සෞඛ්‍ය අමාත්‍යාංශය
சுகாதார அமைச்சு
Ministry of Health

මගේ අංකය ) NA/08/01/2024
எனது இல )
My No. )

ඔබේ අංකය )
உமது இல )
Your No. )

දිනය )
திகதி ) 2024.04.02
Date

0060 3

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය
07 MAY 2024
95312

පොදු චක්‍රලේඛ ලිපි අංක - 02-55/2024

# රජයේ හෙද නිලධාරීන්ගේ සංගමය

සියළුම පළාත් සෞඛ්‍ය ලේකම්වරුන්
ශ්‍රී ලංකා ජාතික රෝහලේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
සියළුම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්
සියළුම ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්
සියළුම ශික්ෂණ රෝහල් හා මහ රෝහල් අධ්‍යක්ෂවරුන්
වෛද්‍ය අධිකාරිවරුන්/විශේෂිත ව්‍යාපාර අධ්‍යක්ෂවරුන්
අදාල ආයතන ප්‍රධානීන් වෙත

<u>සෞඛ්‍ය අංශයේ කාර්යය මණ්ඩලය සඳහා නිල ඇඳුම් දීමනා සංශෝධනය</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් 2014.01.29 දිනැතිව නිකුත් කරන ලද අංක 02-09/2014, 02-10/2014, 02-11/2014, 02-12/2014, 02-13/2014 හා 2014.12.19 දිනැතිව නිකුත් කරන ලද 02-175/2014 යන පොදු චක්‍රලේඛ ලිපි හා බැඳේ.

02. සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිල ඇඳුම් දීමනා හිමි පහත තනතුරුවල නිලධාරීන් සඳහා අනුමත නිල ඇඳුම් දීමනා පහත වගුවේ සඳහන් පරිදි සංශෝධනය කිරීමට භාණ්ඩාගාර ලේකම්ගේ අංක BD/HRD/111/09/2024 හා 2024.03.18 දිනැති ලිපියෙන් එකඟතාවය ලබා දී ඇත.

| තනතුරු නාමය | වසරකට දැනට ගෙවනු ලබන දීමනාව (රු.) | 2024 වර්ෂයේ සංශෝධිත නිල ඇඳුම් දීමනාව (රු.) | 2024 වර්ෂය සඳහා වැඩි කරන ලද ප්‍රමාණය (රු.) | 2025.01.01 දින සිට සංශෝධිත දීමනාව (රු.) |
|---|---|---|---|---|
| හෙද නිලධාරී | රු. 15,000/- | රු. 25,000/- | රු.10,000/- | රු. 30,000/- |
| පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනි | රු. 14,000/- | රු. 23,000/- | රු.9,000/- | රු. 28,000/- |
| මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරී | රු. 15,000/- | රු. 25,000/- | රු.10,000/- | රු. 30,000/- |
| මැලේරියා/බරවා මර්ධන සහයක මහජන සෞඛ්‍ය ක්ෂේත්‍ර නිලධාරී, කීට විද්‍යා සහකාර, පාසල් දන්ත චිකිත්සක | රු. 10,300/- | රු. 17,000/- | රු.6,700/- | රු. 20,600/- |
| පශු එන්නත්කරු, සත්ත්ව ඒකක පාලක, සෞඛ්‍ය රියදුරු | රු. 9,300/- | රු. 15,000/- | රු.5,700/- | රු. 18,600/- |

| | | | | |
|---|---|---|---|---|
| කණිෂ්ඨ සෞඛ්‍ය කාර්ය මණ්ඩලය<br>සෞඛ්‍ය කාර්ය සහයක(කණිෂ්ඨ/සාමාන්‍ය)<br>උපස්ථායක (කාන්තා/පිරිමි)<br>රෝහල් ඕවර්සියර්,අරක්කැමි,කරණවැමි<br>විදුලි සෝපාන ක්‍රියාකරු<br>කාර්යාල කාර්ය සහයක,<br>පාපැදි පණිවුඩකරු, මුර්කරු<br>රසායනාගාර සහයක<br>ඉසින යන්ත්‍ර ක්‍රියාකරු | රු. 9,300/- | රු. 15,000/- | රු.5,700/- | රු. 18,600/- |

03. ඒ අනුව භාණ්ඩාගාර ලේකම්ගේ ඉහත එකඟතාව පරිදි නිල ඇඳුම් හිමි තනතුරු සඳහා 2024 වර්ෂය සඳහා වැඩි කරන ලද නිල ඇඳුම් දීමනාව 2024 මැයි මස සිට ගෙවීමට හා 2025 වර්ෂයට හිමි සංශෝධිත නිල ඇඳුම් දීමනාව 2025 මාර්තු මස ගෙවීමට මෙයින් අනුමැතිය ලබා දෙමි.

04. නිල ඇඳුම් සම්බන්ධව නිකුත් කර ඇති චක්‍රලේඛවල අනෙකුත් විධිවිධාන ඒ අයුරින්ම ක්‍රියාත්මක වන බව වැඩිදුරටත් දන්වමි.

වෛද්‍ය පී.ජී. මහිපාල
සෞඛ්‍ය ලේකම්

වෛද්‍ය පී. ජී. මහීපාල
ලේකම්
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

පිටපත් -

01. ලේකම්, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය - දැ.ගැ.ස.
02. ආයතන අධ්‍යක්ෂ ජනරාල් - දැ.ගැ.ස.
03. අධ්‍යක්ෂ ජනරාල්, කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව - දැ.ගැ.ස.
04. විගණකාධිපති - දැ.ගැ.ස.